සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2022.12.23 |

සියලු ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

**සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම සඳහා සුදුසු තැනැත්තන් තේරීමේ වැඩසටහන - 2022**

**II වන අදියර - සංගණන කටයුතු ආරම්භ කිරීම.**

ඔබ හොඳින් දන්නා පරිදි රාජ්‍ය සේවයේ පරමාර්ථය වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල හා ප්‍රජාතාන්ත්‍රිකව පත්වී ඇති රජයට සහය වීම, බලයට පත්වී සිටින රජයට සිය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට හා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහය වීම, පුරවැසියන්ට කාර්යක්ෂම හා ඵලදායී මහජන සේවයක් පිරිනැමීම, දිගුකාලීන පොදු යහපත සැලසීම සඳහා රජයට සහය වීම, පුරවැසිභාවය සක්‍රීය කිරීම උදෙසා පහසුකම් සැපයීම හා නීතිය අනුව කටයුතු කිරීම යනාදියයි. මේ අර්ථයෙන් ගත්කළ 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනත ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රතිපත්තිමය වශයෙන් තීරණය කර පනතේ විධිවිධාන අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර එහි කටයුතු පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් යොදවා තිබේ. ඒ අනුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම සඳහා සුදුසු තැනැත්තන් තෝරා ගැනීම - 2022 වැඩසටහනේ මුල් අදියර - අයදුම්පත් ලබාගැනීම හා ඒවායේ දත්ත පද්ධති ගත කිරීමට ඔබෙන් හා ඔබේ නිලධාරීන්ගෙන් ලද නොමඳ සහය අනුව ඉතා සාර්ථකව නිම කර තිබේ.

02. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති සියලුම මූලික අයිතිවාසිකම් (එහි (ඇ) වගන්තිය අනුව වෘත්තීය සමිති පිහිටුවීම සහ වෘත්තීය සමිති වලට බැඳීමේ නිදහසට) එහි (උ) අනුව එකලාව හෝ අන් අය හා සමඟ යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ වෘත්තියක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට හිමිකම් තිබුණද, මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා ගැන කියවෙන 15 වන ව්‍යවස්ථාවේ 7 වන අනු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි එම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැකිවන්නේ ද ක්‍රියාත්මක වන්නේ ද එහි සඳහන්ව ඇති අනෙකුත් කරුණු මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුබසාධනය සඳහා යුක්ති සහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිණිසත් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය. එමෙන්ම 16 වන ව්‍යවස්ථාවේ (1) හා (2) අනුව්‍යවස්ථා අනුව සියලු පවත්නා ලිඛිත නීති, මූලික අයිතිවාසිකම් විධිවිධාන වලට අනුකූල නොවුවද බලාත්මකව ක්‍රියාත්මක වන අතර කවර හෝ ලිඛිත නීතියක දඬුවමක් ලෙස පිළිගනු ලැබූ කවර හෝ දඬුවමකට, කවර වූ හෝ තැනැත්තකු නිසි අධිකරණයක ආඥාව පිට යටත් කිරීම, මූලික අයිතිවාසිකම් කඩ කිරීමක් නොවන්නේය.

03. ඉහත කී පැහැදිලි කිරීම් වලට යටත්ව හා 2002 අංක 24 සුබසාධක ප්‍රතිලාභ පනතේ 8(1) වගන්තිය අනුව ඔබට පැවරු බලතල හා 15 වන වගන්තියෙන් කියවෙන ඔබේ වගබලා ගැනීම අනුව උක්ත වැඩසටහනේ ක්‍රියාත්මක කළ යුතු දෙවන අදියර වන්නේ 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ පනවා ඇති 2022 අංක 01 දරණ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් (ගෙවීම් ලැබීම සඳහා සුදුසු තැනැත්තන් තෝරාගැනීම) නියෝග හා 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන පරිදි පනවා ඇති 2022 අංක 02 දරණ ඒකාබද්ධ පද්ධති නියෝගය අනුව ඉල්ලුම්කරුවන් විසින් කරනු ලබන ප්‍රකාශනය නිවැරදිව ලබා ගැනීම සඳහා සංගණන නිලධාරීන් විසින් ඉල්ලුම්කරුවන් පදිංචි නිවාස වෙත යැමයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ / ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ගත් කළ ඒ සඳහා පහත සඳහන් පියවරයන් සපුරා තිබිය යුතුය.

1. මූලික ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ දත්ත පද්ධති ගත කිරීම.
2. එම දත්ත නිවැරදි කිරීම / සංස්කරණය.
3. ඉහත සඳහන් කළ නියෝගයන් අනුව තේරීම් කමිටු පත්කිරීම.
4. ඒ අනුව සංගණන නිලධාරීන්ට තාක්ෂණික පුහුණුව (ජංගම යෙදවුම හා දත්ත රැස්කිරීම සම්බන්ධ) ලබා දී තිබීම.
5. දත්ත රැස්කිරීමේ උපදෙස් අත්පොත සංගණන නිලධාරීන්ට ලබා දී තිබීම.

04. ඉහත වැඩ පියවරයන් සම්පූර්ණ කර ඇති ග්‍රාම නිලධාරී වසම්වල පදිංචි අදාළ ඉල්ලුම්කරුවන්ගෙන් ඉහත සඳහන් කළ ප්‍රකාශනය ලබා ගැනීම සඳහා කටයුතු සිදු කිරීමටත් ඒ අනුව දත්ත පද්ධති ගත කිරීමටත් අවශ්‍ය පියවර ගන්නා ලෙස මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහය ඉතා අගය කොට සලකමි.

බී.විජයරත්න
සභාපති/කොමසාරිස් o/c
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

පිටපත්:-
01. ගරු නීතිපතිතුමා - ඔබේ E/362/2022 හා 2022.12.06 දිනැති ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ඇමතූ ලිපිය සබැඳිව කාරුණික දැන ගැනීම සඳහා
02. ජනාධිපති ලේකම් - කා.දැ.ගැ.පි
03. අග්‍රාමාත්‍ය ලේකම් - ඔබේ ප්‍රධානත්වයෙන් 2022.12.20 දින පැවති ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ලබා දුන් උපදෙස් පරිදි කාරුණික දැන ගැනීම සඳහා.
04. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි
05. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි
06. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය- කා.දැ.ගැ.පි
07. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි
08. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් - කා.දැ.ගැ.පි
09. සියලුම දිසාපතිවරුන් - කා.දැ.ගැ.පි